(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **78.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2021 ජූනි 08 අඟහරුවාදා පූ. භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** වරාය හා නාවික අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** විදුලිබල අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් රාජපක්ෂ මහතා,** තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** ප්‍රවාහන අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** සෞඛ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කාබනික හා ස්වභාවික පොහොර නිෂ්පාදන, සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු නසීර් අහමඩ් මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ජගත් කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු ගයාෂාන් නවනන්ද මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු රවුෆ් හකීම් මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන :** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2021 මැයි 27 දින මා විසින් 'කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැන්වීමට කැමැත්තෙමි."

**II**

" 'ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය' නමැති පනත් කෙටුම්පත, ස්ථාවර නියෝග 51 (2) (අ) යටතේ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම පිණිස එක් එක් පළාත් සභාවට යොමු කරන ලදි.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 51(2) (ආ) අනුකූලව, පාර්ලිමේන්තුවට වාර්තා කිරීම පිණිස පළාත් සභාවට ලබා දුන් මාස දෙකක කාලය 2021.05.31 වැනි දින ඉකුත් විය.

ඒ අනුව, බස්නාහිර පළාත් සභාව, දකුණු පළාත් සභාව, උතුරු පළාත් සභාව සහ සබරගමුව පළාත් සභාවල ආණ්ඩුකාරවරුන් විසින් එකී පළාත් සභා විසුරුවා ඇති බැවින් 154උ (5) (අ) ව්‍යවස්ථාවට අනුකූලව අදහස් දැක්වීමක් සිදු කිරීමේ හැකියාවක් නොමැති බව දන්වා ඇත. මධ්‍යම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එම පළාත් සභාවේ විරුද්ධත්වයක් නොමැති බව දන්වා ඇත. අනෙකුත් පළාත් සභාද විසුරුවා ඇති අතර ඔවුන් විසින් අදාළ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දැක්වීමක් සිදුකර නොමැත."

**2. ලිපි ලේඛනාදිය පිළිගැන්වීම:** (1) මහාමාර්ග අමාත්‍යවරයා විසින්—

(i) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 23 දිනැති අංක 2224/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි; සහ

(ii) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 23 දිනැති අංක 2224/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි

පිළිගන්වා එම රෙගුලාසි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(2) ඉඩම් අමාත්‍යවරයා විසින් (460 වන අධිකාරය වූ) 1950 අංක 09 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63(2) ඡේදය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මාර්තු 18 දිනැති අංක 2219/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කර එම නියෝග, ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වන වගන්තිය යටතේ නියමයන්; සහ

(iii) 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) කොච්චිකඩේ, උ/ පල්ලන්සේන, බණ්ඩාරවත්ත, අංක 40/11 දරන ස්ථානයෙහි පදිංචි ජී. බී. ඒ. ජෙරාඩ් සුමිත් සිල්වා මහතාගෙන් ලැබුණු 2021.02.26 දිනැති පෙත්සම; සහ

(ii) මීගමුව, ශාන්ත ජෝන්ස් පාර, අංක 11 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. චන්දන නිශාන්ත කොස්තා මහතාගෙන් ලැබුණු 2020.09.21 දිනැති පෙත්සම

ගරු නිමල් ලාන්සා මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) බුස්ස, පිටිවැල්ල, ඇලබඩවත්ත, අංක 71/බී දරන ස්ථානයෙහි පදිංචි ඒ. පී. ශාන්ත මහතාගෙන් ලැබුණු 2021.02.14 දිනැති පෙත්සම;

(ii) හැටන්, මොරහේනගම, කොල්හේන, අංක 132/1 දරන ස්ථානයෙහි පදිංචි ඩී. පී. ජයසේන මහතාගෙන් ලැබුණු 2021.02.08 දිනැති පෙත්සම;

(iii) උස්සාපිටිය, ගොඩිගමුව, "ගාමිණී සෙවණ" යන ලිපිනයෙහි පදිංචි ඩී. පී. මධුෂා හර්ෂණී ශශිකලා මහත්මියගෙන් ලැබුණු 2021.03.03 දිනැති පෙත්සම; සහ

(iv) මාතලේ, දොඩම්දෙණිය, අංක 42/3 දරන ස්ථානයෙහි පදිංචි ටී. එම්. වරුණි ශශිප්‍රභා තෙල්වඩන මහත්මියගෙන් ලැබුණු 2021.02.18 දිනැති පෙත්සම

ගරු තිස්ස අත්තනායක මහතා විසින් පිළිගන්වන ලදී.

(3) ඉඹුල්ගස්දෙණිය, අඹුවන්ගල, අංක සී 3/1 දරන ස්ථානයෙහි පදිංචි ඒ. ඒ. රණසිංහ මහතාගෙන් ලැබුණු 2021.03.22 දිනැති පෙත්සම ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(4) මහනුවර, මහයියාව, පිටකන්ද පාර, අංක 51 දරන ස්ථානයෙහි පදිංචි එස්.කේ.මාපලගම මහතාගෙන් ලැබුණු 2021.02.16 දිනැති පෙත්සම ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(5) හොරණ, කඳන (උතුර) යන ලිපිනයෙහි පදිංචි ඊ. ඩී. චන්ද්‍රාවතී මහත්මියගෙන් ලැබුණු 2021.03.05 දිනැති පෙත්සම ගරු ලලිත් එල්ලාවල මහතා විසින් පිළිගන්වන ලදී.

(6) රණාල, නවගමුව දකුණ, අංක 533/2 දරන ස්ථානයෙහි පදිංචි අයි. එම්. රෝහිත ගුණවර්ධන මහතාගෙන් ලැබුණු 2020.12.20 දිනැති පෙත්සම ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා විසින් පිළිගන්වන ලදී.

(7) මාතලේ, නාගොල්ල පාර, අංක 146 දරන ස්ථානයෙහි පදිංචි ජේ. ජී. මානෙල් කුමාරි විජේරත්න මහත්මියගෙන් ලැබුණු 2021.04.20 දිනැති පෙත්සම ගරු කිංස් නෙල්සන් මහතා විසින් පිළිගන්වන ලදී.

(8) (i) අවිස්සාවේල්ල, හොනිටන් පෙදෙස, රාජසිංහ මාවත, අංක 47/101 දරන ස්ථානයෙහි පදිංචි ලියනගේ තිලකරත්න මහතාගෙන් ලැබුණු 2021.03.25 දිනැති පෙත්සම; සහ

(ii) කොළඹ 04, සාගර පාර, අංක 23, 7/6 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඕ. ගමගේ මහත්මියගෙන් ලැබුණු 2021.02.25 දිනැති පෙත්සම

ගරු යදාමිණී ගුණවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) (තාවකාලික විධිවිධාන):** අධිකරණ අමාත්‍යවරයා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයන් හේතුවෙන් නියම කරනු ලැබ ඇති කාලසීමාවක් තුළ ඉටු කිරීමට නීතිය මඟින් නියම කරන ලද ඇතැම් ක්‍රියාවන් ඉටු කිරීමට පුද්ගලයන්හට නොහැකි වූ අවස්ථාවන් සම්බන්ධයෙන් ද; කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයන් හේතුවෙන් යම් අධිකරණයකට එහි කටයුතු සිදු කරගෙන යාමට නොහැකි වන අවස්ථාවක දී විකල්ප අධිකරණයක් නියම කිරීම සඳහා ද; 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) පාලනය කිරීමට පහසුකම් සැලැස්වීම සඳහා දුරස්ථ සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් අධිකරණ කටයුතු සිදු කරගෙන යාම සඳහා ද; කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයන් හේතුවෙන් ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට නොහැකි වූ ඇතැම් ගිවිසුම්වල පාර්ශවයන් සම්බන්ධයෙන් සහනයක් ලබාදීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා තාවකාලික විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2021 ජූනි 22 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද, එය මුද්‍රණය කළ යුතු යැයි ද අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**6. වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය (සංශෝධන):** අධිකරණ අමාත්‍යවරයා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 1994 අංක 22 දරන වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහිව වූ සම්මුතිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2021 ජූනි 22 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද, එය මුද්‍රණය කළ යුතු යැයි ද අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 4.30 දක්වා විය යුතු ය. මධ්‍යාහ්න 12.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 4.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2021 ජූනි 22 අඟහරුවාදා පූ.භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9. **මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය"යි අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 3 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනි වර කියවිය යුතු ය"යි අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**10. විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1):** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 58 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 58 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 33101 "රජයේ සේවකයන්ගේ අත්තිකාරම් ගිණුම - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 47,300,000 සිට රු. 42,500,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2):** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ

අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 59 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 59 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 22302 "ගබඩා අත්තිකාරම් ගිණුම (පුපුරණ ද්‍රව්‍ය) - ශ්‍රී ලංකා නාවික හමුදාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 620,000,000 සිට රු. 450,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3):** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 60 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 60 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 25002 "වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම් සඳහා අත්තිකාරම් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| <u>අයිතමය</u> | | <u>සංශෝධනය</u> |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,000,000 සිට රු. 1,120,600 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**13. විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4):** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 61 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 61 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 25003 "විවිධ අත්තිකාරම් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| <u>අයිතමය</u> | | <u>සංශෝධනය</u> |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,000,000 සිට රු. 430,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**14. විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5):** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 62 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 62 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 28502 ''කෘෂිකාර්මික ගොවිපළ නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුම - කෘෂිකාර්මික දෙපාර්තමේන්තුව'' වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 620,000,000 සිට රු. 645,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 620,000,000 සිට රු. 645,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**15. විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6):** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 63 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 63 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "ගබඩා අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,700,000,000 සිට රු.1,000,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු.7,500,000,000 සිට රු.8,200,000,000දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**16. විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 7):** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 64 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 64 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31002 "ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ

කර්මාන්ත ශාලාව'' වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 120,000,000<br>රු. 50,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 40,000,000<br>රු. 70,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**17. විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 8):** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 65 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 65 දරන නියමය

මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 31003 ''කළවැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව'' වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මඟින් සංශෝධනය කරමි.

| | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 420,000,000 සිට<br>රු.300,000,000 දක්වා |

| | | |
|---|---|---|
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2020.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**18. විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 9):** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා වෙත පැවරුනු බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

## උපලේඛනය

## 2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2020 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

### කණ්ඩායම් විධාන අංක 01

2020 අංක 6 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතලවලට අනුව මහින්ද රාජපක්ෂ වන මම, මුදල් අමාත්‍යවරයා වශයෙන් රජයේ අනුමතිය අනුව මේ සමඟ දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්වල විෂය අංක 00601, 01701, 02001, 02301, 10101, 10301, 11201, 11501, 11801, 12201, 12301, 12601, 13001, 13501, 15101, 17601. 19301, 19401, 19801, 40101, 40301, 40401, 40501, 40601, 40801, 40901, 41001, 41101, 41201, 41401, 41601, 41701, 41901, 42101, 42201, 42301, 42401, 42501, 42601, 42701, 42801, 42901, 43001, 43101, 43301, 43401, 43501, 43601, 43701, 43801, 43901, 44001, 20901, 21601, 23501 , 27201 සහ 27701ට අදාළ වන්නා වූ පනතේ තෙවැනි උපලේඛනය තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක III හි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය | 00601 | | | | | 30,000,000 | 38,000,000 | 1 |
| 2 | පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය | 01701 | | | 2,000,000 | 1,100,000 | | | 2 |
| 3 | මැතිවරණ කොමිෂන් සභාව | 02001 | | | | | 85,000,000 | 115,000,000 | 3 |
| 4 | විගණන සේවා කොමිෂන් සභාව | 02301 | | | 1,600,000 | 600,000 | 4,000,000 | 6,000,000 | 4 |
| 5 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා | 10101 | | | 31,000,000 | 8,000,000 | | | 5 |
| 6 | ආරක්ෂක අමාත්‍යවරයා | 10301 | 38,500,000 | 75,000,000 | | | | | 6 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 7 | විදේශ අමාත්‍යවරයා | 11201 | | | | | 120,000,000 | 124,000,000 | 7 |
| 8 | බලශක්ති අමාත්‍යවරයා | 11501 | | | 2,500,000 | 2,400,000 | | | 8 |
| 9 | කෘෂිකර්ම අමාත්‍යවරයා | 11801 | | | 33,000,000 | 29,000,000 | | | 9 |
| 10 | ඉඩම් අමාත්‍යවරයා | 12201 | | | 12,500,000 | 9,000,000 | | | 10 |
| 11 | නාගරික සංවර්ධනය හා නිවාස අමාත්‍යවරයා | 12301 | 7,100,000 | 37,000,000 | | | | | 11 |
| 12 | අධ්‍යාපන අමාත්‍යවරයා | 12601 | | | | | 2,540,000,000 | 3,100,000,000 | 12 |
| 13 | රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා | 13001 | | | 28,500,000 | 22,000,000 | | | 13 |
| 14 | වැවිලි අමාත්‍යවරයා | 13501 | | | 14,500,000 | 5,820,000 | | | 14 |
| 15 | ධීවර අමාත්‍යවරයා | 15101 | | | 4,000,000 | 2,100,000 | | | 15 |
| 16 | වරාය හා නාවික අමාත්‍යවරයා | 17601 | | | | | 18,000,000 | 18,600,000 | 16 |
| 17 | කම්කරු අමාත්‍යවරයා | 19301 | | | | | 52,000,000 | 55,600,000 | 17 |
| 18 | තරුණ හා ක්‍රීඩා අමාත්‍යවරයා | 19401 | | | 21,500,000 | 14,300,000 | | | 18 |
| 19 | වාරිමාර්ග අමාත්‍යවරයා | 19801 | | | 4,400,000 | 2,500,000 | 40,000,000 | 50,000,000 | 19 |
| 20 | ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්ප ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා | 40101 | | | 1,200,000 | 500,000 | | | 20 |
| 21 | කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යවරයා | 40301 | | | 28,000,000 | 14,500,000 | | | 21 |
| 22 | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 40401 | | | 1,500,000 | 0.000 | | | 22 |
| 23 | විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යවරයා | 40501 | | | 950,000 | 86,000 | | | 23 |
| 24 | සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 40601 | | | 1,200,000 | 266,000 | | | 24 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 25 | වේවැල්, පිත්තල, මැටි, ලී බඩු හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 40801 | | | 23,500,000 | 3,800,000 | | | 25 |
| 26 | අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමණාකරණ රාජ්‍ය අමාත්‍යවරයා | 40901 | 52,300,000 | 551,000,000 | | | | | 26 |
| 27 | සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්ත ශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 41001 | | | 2,000,000 | 74,000 | | | 27 |
| 28 | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා | 41101 | | | 4,200,000 | 3,900,000 | | | 28 |
| 29 | විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යවරයා | 41201 | | | 26,500,000 | 13,000,000 | 50,000,000 | 64,000,000 | 29 |
| 30 | සමෘද්ධි සහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 41401 | 4,400,000 | 5,600,000 | | | | | 30 |
| 31 | දේශීය වෛද්‍යකම ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යවරයා | 41601 | | | 10,000,000 | 4,200,000 | | | 31 |
| 32 | වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යවරයා | 41701 | | | 7,200,000 | 7,126,989.02 | | | 32 |
| 33 | කලාපීය සහයෝගීතා කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා | 41901 | | | 500,000 | 350,000 | | | 33 |
| 34 | නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යවරයා | 42101 | | | 18,000,000 | 16,000,000 | | | 34 |
| 35 | දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යවරයා | 42201 | 5,600,000 | 30,000,000 | | | | | 35 |
| 36 | ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යවරයා | 42301 | | | 4,000,000 | 2,750,000 | | | 36 |
| 37 | වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 42401 | | | 1,200,000 | 65,000 | | | 37 |
| 38 | වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවලු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යවරයා | 42501 | | | 2,200,000 | 20,000 | | | 38 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 39 | පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යවරයා | 42601 | 9,500,000 | 200,000 | 39 |
| 40 | පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා | 42701 | 12,200,000 | 9,500,000 | 40 |
| 41 | මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 42801 | 1,000,000 | 400,000 | 41 |
| 42 | ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 42901 | 1,500,000 | 205,000 | 42 |
| 43 | ඉඩම් කළමණාකරන කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 43001 | 1,000,000 | 120,000 | 43 |
| 44 | පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යවරයා | 43101 | 1,500,000 | 70,000 | 44 |
| 45 | ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 43301 | 850,000 | 50,000 | 45 |
| 46 | ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 43401 | 1,200,000 | 35,000 | 46 |
| 47 | ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යවරයා | 43501 | 1,000,000 | 200,000 | 47 |
| 48 | වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා | 43601 | 1,500,000 | 80,000 | 48 |
| 49 | ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 43701 | 1,200,000 | 100,000 | 49 |
| 50 | සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යවරයා | 43801 | 2,500,000 | 2,000,000 | 50 |
| 51 | බතික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යවරයා | 43901 | 1,200,000 | 100,000 | 51 |
| 52 | මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා | 44001 | 850,000 | 45,000 | 52 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 53 | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | 20901 | | | 3,600,000 | 3,100,000 | 53 |
| 54 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 21601 | | | 13,400,000 | 12,500,000 | 54 |
| 55 | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | 23501 | | | 700,000 | 472,256 | 55 |
| 56 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල | 27201 | 80,000,000 | 85,000,000 | | | 56 |
| 57 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල | 27701 | 30,000,000 | 30,580,000 | | | 57 |

අත්සන් කළේ / මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021.05. 12 වැනි දින,
කොළඹ 01.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**19. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි:** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අප්‍රේල් 06 දිනැති අංක 2222/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.18 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**20. කල් තැබීම (රාජ්‍ය යාන්ත්‍රණය නිසි පරිදි ක්‍රියාත්මක නොවීමෙන් මතුව ඇති අර්බුදය):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින් විවාද විය.

(අ. භා. 12.08 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 12.27ට ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.)

"ගරු සංජීව එදිරිමාන්න මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි වාරිමාර්ග අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 1.33 ට ගරු සංජීව එදිරිමාන්න මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි වාරිමාර්ග අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 2.25ට ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි වාරිමාර්ග අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.44 ට ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ. භා. 4.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා අද දින සභා සම්මතිය අනුව, පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව 2021 ජූනි 22 අඟහරුවාදා පූ.භා 10.00 වනතෙක් කල් ගියේය.